

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන

## යල කන්නය 2020

# උඳු වගාව

අඩු ජල තත්ත්ව යටතේ වගා කිරීමට හැකි බෝගයක් වීම නිසා මෙන්ම ඉදිරියේදී ආනයනය සීමා කිරීමට ඉඩ ඇති නිසා මෙවර යල කන්නය සඳහා අඩු ජල තත්ත්ව ඇති කුඹුරු ඉඩම්වලට ඉතා හොඳ බෝගයකි.

- මෙය ලංකාවේ වියළි හා අතරමැදි කලාප සඳහා යෝග්‍යය.

- වගා කරන ප්‍රභේද වන්නේ,
  - MI 1 - (දින 85-90 අස්වනු නෙළිය හැක)
  - අනුරාධ - (දින 75-80 අස්වනු නෙළිය හැක)

**වගාව ආරම්භ කළ යුත්තේ අස්වනු නෙළීම වියළි කාලයට එන ලෙසටය.**

- අක්කර එකක් වගා කිරීමට බීජ කිලෝ ග්‍රෑම් 12 ක් අවශ්‍ය වේ.

**බීජ ක්ෂේත්‍රයේ සිටුවීමට පෙර ප්‍රරෝහණය පරීක්ෂා කර බලන්න.**
**එහි ගැටළුවක් පවතී නම් බීජ ලබා ගත් ස්ථානය දැනුවත් කරන්න.**

- වගාව පිහිටුවීම සඳහා ගැඹුරට පස පෙරළා කැට පොඩිකර, ඇලි වැටි හෝ උස පාත්ති සකස් කර ගන්න.

**වියළි කාලයේ දී ජලය රැඳී තිබෙන බිම්වල ගැඹුරට කාණු සකසා ගන්න.**

- රෝග පළිබෝධවලින් වගාව ආරක්ෂා කර ගැනීම සඳහා කෘෂිකර්ම උපදේශක මහතාගේ උපදෙස් මත සුදුසු රසායනිකයකින් බීජ ප්‍රතිකාර කරන්න.

- බීජ සිටුවීමට පෙර පසට කාබනික පොහොර එක් කරන්න.

- පාංශු පරීක්ෂාවකින් අනතුරුව අවශ්‍ය මූලික රසායනික පොහොර යෙදීම සිදුකිරීමට කෘෂිකර්ම උපදේශක මහතාගෙන් උපදෙස් ලබාගන්න.

**පේළි අතර පරතරය අඩි 1 1/2**
**පැළ අතර පරතරය අඟල් 4**
**එක ස්ථානයකට බීජ 2 බැගින් (සෙ.මි. 1.5 ගැඹුරින්) යොදන්න.**

- බීජ සිටුවන අවස්ථාවේ ප්‍රමාණවත් තෙතමනයක් පසේ තිබිය යුතුය.

**බීජ පැළ වලට දින 10-12ක දී හොඳින් වැඩුනු නිරෝගී පැළය ඉතිරි කර අනෙක් පැළය ඉවත් කරන්න**

- පසේ පවතින තෙතමනය අනුව අවශ්‍ය අවස්ථාවන්හි දී ජල සම්පාදනය කරන්න

- මල් පිපෙන හා කරල් පිරෙන අවස්ථාවල දී පසේ තෙතමනය ප්‍රමාණවත් පරිදි පවත්වා ගැනීම වැදගත්ය.

**මල් හට ගන්නා අවස්ථාවේ දී අක්කරයට කිලෝ ග්‍රෑම් 12 ක් වන ලෙස යූරියා යොදන්න. (කෘෂිකර්ම උපදේශක මහතාගේ උපදෙස් මත)**

- හොඳින් ශාකය වර්ධනය වන තුරු දෙවරක් වල්පැළ පාලනය කරන්න. (පැළ තුනී කිරීමේ දී සහ මතුපිට පොහොර යෙදීමේ දී)

- රෝග සහ පළිබෝධ හානි පාලනය කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් කෘෂිකර්ම උපදේශක මහතාගෙන් ලබා ගන්න.

- කරල් මෝරන විට කළු පැහැයට හැරේ. වගාවෙන් 90% පමණ කළු පාටට හැරෙන විට ගස් සියල්ල එකවර කපා ගන්න.

- හොඳින් වියළා ගත් ශාක ගෝනියක දමා ලීයකින් ගසා හෝ යාන්ත්‍රිකව බීජ වෙන්කර ගන්න.

**වෙන්කර ගත් බීජ හොඳින් වියලීම සිදුකරන්න. (වියලීම පරීක්ෂා කිරීම සඳහා උඳු ඇටයක් සපා බැලූ විට "ටකස්" ශබ්දයෙන් දෙකඩ විය යුතුය)**

- වියළා ගත් බීජය පැය කිහිපයක් තබා පිරිසිදු ගෝනිවල අසුරා වියළි සිසිල් ස්ථානයක අසුරන්න.

- ගබඩා පළිබෝධ හානි අවම කර ගැනීම සඳහා ඇසිරීමේ දී වියළි කොහොඹ කොළ හෝ දෙහි කොළ යෙදීම සුදුසුය.

- හෙක්ටයාරයකින් කිලෝ ග්‍රෑම් 1800 - 2000 පමණ අස්වැන්නක් ගත හැක.

**ඔබගේ ලබන කන්නයේ වගාවට අවශ්‍ය බීජ වෙනුවෙන් මෙම කන්නයේ අස්වැන්නෙන් කොටසක් ආරක්ෂාකාරීව ගබඩා කර තබා ගන්න.**

*"කොරෝනා පරදමු - ආහාර අර්බුදය ජය ගනිමු"*

**උඳු වගාව පිළිබඳව ඔබට ඇතිවන ගැටළු විසදා ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 1920 කෘෂි උපදේශන සේවාවෙන් විමසන්න**

**කෘෂිකර්ම උපදේශක/තාක්ෂණ සහයක/මහවැලි ක්ෂේත්‍ර සහකාර**

| දුරකතන අංකය |
| --- |

NAICC *Designed by :* **NATIONAL AGRICULTURE INFORMATION & COMMUNICATION CENTRE,** Department of Agriculture